

# මෝටර් වාහන රක්ෂණය

INSURANCE
REGULATORY
COMMISSION
OF SRI LANKA

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

# 1.

## මෝටර් වාහන රක්ෂණයක් යනු කුමක්ද?



හදිසි අනතුරකදී හෝ වෙනත් අලාභහානියකින් වාහනයට සිදුවන හානි සඳහා හිමිකරුට මූල්‍යමය ආවරණයක් ලබාදීම මෝටර් වාහන රක්ෂණයකින් සිදුවේ.

2.

# මෝටර් වාහන රක්ෂණයක අවශ්‍යතාවය කුමක්ද?



මහාමාර්ගයේ මෝටර් වාහනයක් ධාවනය කරන සෑම පුද්ගලයෙකුම මෝටර් වාහන රක්ෂණාවරණයක් ලබා ගත යුතුය. මෝටර් වාහන පනතට අනුව වලංගු රක්ෂණාවරණයක් නොමැතිව මහාමාර්ගයක වාහනයක් ධාවනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි. පනත ප්‍රකාර, අවම වශයෙන් තෙවන පාර්ශවීය මෝටර් වාහන රක්ෂණයක් තිබීම අනිවාර්ය වේ.

එනම්, තෙවන පාර්ශවයකට විය හැකි මරණයක් සහ ශාරීරික තුවාල/හානි සම්බන්ධයෙන් වගකීම පිළිබඳ රක්ෂණය මෝටර් වාහන පනතට අනුව අනිවාර්ය වේ.

3.

# වෙළඳපොළෙහි තිබෙන මෝටර් වාහන රක්ෂණ ඔප්පු වර්ග මොනවාද?



මූලික වශයෙන් පහත සඳහන් මෝටර් වාහන රක්ෂණ ඔප්පු වර්ග ශ්‍රී ලංකාවේ වෙළඳපොළෙහි දක්නට ලැබේ.

- **මෝටර් වාහන** පනතට අනුව මූලික/අවම තෙවන පාර්ශවීය **ආවරණය** (Act Only Policy) - මෙමගින් තෙවන පාර්ශවයට සිදුවන ශාරීරික තුවාල සහ මරණ පමණක් ආවරණය කරනු ලබයි.
  - **තෙවන පාර්ශවීය මෝටර් වාහන රක්ෂණය** - මෙමගින් ආවරණය කරනු ලබන්නේ තෙවන පාර්ශවීය ශාරීරික තුවාල සහ මරණ සහ තෙවන පාර්ශවීය දේපළ වලට වන හානී වේ.
  - **තෙවන පාර්ශවීය, ගිනි හා සොරබිය මෝටර් වාහන රක්ෂණය** - මෙම ඔප්පුව මගින් ආවරණය සලස්වන්නේ ගින්නෙන් සහ සොරකම හේතුවෙන් වාහනයට සිදුවන හානි සහ තෙවන පාර්ශවයක දේපළ සහ ශාරීරික තුවාල සහ මරණ වේ.

- **පූර්ණ මෝටර් වාහන රක්ෂණය** - මෙම ඔප්පුව මගින් රක්ෂිතයාගේ වාහනය සහ/හෝ එහි උපාංග වලට සහ අමතර කොටස්වලට සිදුවන අලාභ/හානි ආවරණය කරන අතර රිය අනතුරු, ඇතුළතින් ගිනි ගැනීම්, බාහිර පිපිරීම්, අකුණු සැර වැදීම්, සොරකම් කිරීම් හේතුවෙන් වන හානි සහ තෙවන පාර්ශවයට සිදුවන ශාරීරික තුවාල, මරණ සහ දේපළ හානි ආවරණය කරනු ලබයි.

4.

# මෝටර් වාහන රක්ෂණ වර්ග සහ ආවරණයන්



| ආවරණයන් / මෝටර් වාහන රක්ෂණ ඔප්පු | තෙවන පාර්ශවීය ශරීර හානි හා මරණ | තෙවන පාර්ශවීය දේපල හානි | ගිනි හා සොර සතුරු හානි | වාහන අනතුරු හානි |
|---|---|---|---|---|
| තෙවන පාර්ශවීය පනතේ ආවරණ | ✔ | X | X | X |
| තෙවන පාර්ශවීය රක්ෂණය | ✔ | ✔ | X | X |
| තෙවන පාර්ශවීය ගිනි හා සොරබිය රක්ෂණය | ✔ | ✔ | ✔ | X |
| පූර්ණ මෝටර් රථ වාහන රක්ෂණය | ✔ | ✔ | ✔ | ✔ |

## 5.

# මෝටර් වාහන රක්ෂණයක් සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?



- **රක්ෂණීය අයිතිය** - වාහනයක රක්ෂණීය අයිතිය තිබෙන්නේ එහි අයිතිකරුටයි. එබැවින්, ලියාපදිංචි කළ වාහනයක් මිලදී ගත් වහාම, වාහනයේ ලියාපදිංචිය ඔබ නමින් පවරාගෙන ඔබගේ නමින් රක්ෂණාවරණය ලබාගැනීමට කටයුතු කරන්න.

- **වෙළඳපොළ වටිනාකම** - මෝටර් වාහන රක්ෂණාවරණයක් ලබාගැනීමේදී මෙන්ම තිබෙන රක්ෂණාවරණය අලුත් කිරීමේදී වාහනයේ නියම වෙළඳපොළ වටිනාකම සඳහා රක්ෂණාවරණය ලබාගන්න. පවතින අගයට වඩා අඩු අගයකට ඔබගේ වාහනය රක්ෂණය කළහොත් හිමිකම් ඉල්ලීමකදී සිදු වූ අලාභයට වඩා අඩු රක්ෂණ වන්දියක් ලැබෙන අතර වෙළඳපොළ වටිනාකමට වඩා වැඩි අගයකට රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණද, රක්ෂණ වන්දි ගෙවීම වාහනයේ වෙළඳපොළ වටිනාකම පදනම් කරගෙන සිදුකරයි.

- **වාහනයේ භාවිතයට ගැලපෙන රක්ෂණාවරණය** - වාහනය භාවිතා කරන්නේ කුමන කාරණාවක් සඳහාද එනම්, පෞද්ගලික, මගී හෝ භාණ්ඩ ප්‍රවාහනය, රියදුරු පුහුණුව ආදී කරුණු යෝජනා පත්‍රය මගින් රක්ෂණ සමාගම වෙත හෙළිදරව් කළ යුතුය. රක්ෂණ ඔප්පුහිමියා විසින් ගෙවිය යුතු වාරිකය සහ රක්ෂණාවරණයට අදාල කොන්දේසි තීරණය කරනු ලබන්නේ වාහනයේ අපේක්ෂිත භාවිතය මත වන බැවින් වාහනයේ භාවිතයට ගැලපෙන පරිදි රක්ෂණාවරණයක් ලබා නොගතහොත් රක්ෂණ වන්දි ප්‍රතික්ෂේප විය හැක.




**එමෙන්ම රක්ෂණ ඔප්පුවේ සඳහන් ආවරණ සහ බැහැර කරන ලද ආවරණ සම්බන්ධයෙන් හොඳින් කියවා අවබෝධ කරගත යුතු අතර තමන්ට අවශ්‍ය ආවරණ අමතර වාරිකයක් ගෙවා හෝ ලබාගැනීම වැදගත් වේ.**

- **රක්ෂණ සමාගමක් තෝරාගැනීමේ අයිතිය** - රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචි වූ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ යෙදෙන රක්ෂණ සමාගමකින් සෘජුවම හෝ ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගමකින් හෝ බලයලත් රක්ෂණ නියෝජිතයෙකු මාර්ගයෙන් මෝටර් වාහන රක්ෂණාවරණයක් ලබාගත හැක. යම් නිශ්චිත රක්ෂණ සමාගමකින් රක්ෂණාවරණයක් ලබාගන්නා ලෙස කිසිවෙකුටත් බලපෑම් කළ නොහැක.

- **වාරික ගෙවීමේ බැඳුම්කරය** (Premium Payment Warranty) - රක්ෂණාවරණය ආරම්භ වූ දිනයේ සිට දින 60 ක කාලසීමාව ඉකුත්වීමට පෙර සම්පූර්ණ රක්ෂණ වාරිකය ගෙවා නිමකල යුතු බවට රක්ෂණ සමාගම එකඟ වී තිබෙන අවස්ථාවක එම කාල සීමාව ඉකුත්වීමට පෙර සම්පූර්ණ වාරික මුදල ගෙවිය යුතුය. එසේ නොකළහොත් දැනුම්දීමකින් තොරව රක්ෂණ ඔප්පුව අවලංගු වේ.

- **අනතුරක් වූ වහාම දැනුම්දීම** - වාහනය අනතුරට ලක් වු වහාම, ඒ පිළිබඳව අදාල රක්ෂණ සමාගමට දැනුම් දී හිමිකම් ලබැගැනීම සඳහා අනුගමනය කළ යුතු පියවර පිළිබඳ නිසි උපදෙස් ලබාගැනිම වැදගත්ය. රියදුරු විසින් අනතුර පිළිබඳව ළඟම තිබෙන පොලිස් ස්ථානයට දැනුම්දීමද අනිවාර්ය වේ.

- **ඔප්පුවක වලංගු කාලය** - මෝටර් වාහන රක්ෂණාවරණයක් වසරක කාලයක් සඳහා වලංගු වේ. කාලය ඉකුත්වීමට පෙර රක්ෂණාවරණය අලුත් කරගත යුතුය.

# මෝටර් වාහන රක්ෂණයකදී කළයුතු හා නොකළ යුතු දෑ

6.



**අ) කළ යුතු දෑ;**

- ඔබගේ මෝටර් වාහන රක්ෂණාවරණය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ යෙදෙන ලියාපදිංචි රක්ෂණ සමාගමකින් සෘජුවම හෝ ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගමකින් හෝ බලයලත් රක්ෂණ නියෝජිතවරයෙකු මාර්ගයෙන් ලබාගත යුතුය.
- රක්ෂණාවරණයේ අයිතිකරු විසින්ම රක්ෂණ යෝජනා පත්‍රය සම්පූර්ණ කළ යුතුය. මෙහිදී සත්‍ය කරුණු ඇතුළත් කිරීම ඉතාම වැදගත් වේ.
- මෝටර් රථය කුමන කාර්යය සඳහා භාවිතා කරනවාද යන්න යෝජනා පත්‍රයේ සඳහන් කිරීම අදාළ රක්ෂණාවරණය ලබාගැනීමේදී ඉතාම වැදගත් වේ.
- සම්පූර්ණ කරන ලද රක්ෂණ යෝජනා පත්‍රයේ පිටපතක් ළඟ තබාගන්න.
- රක්ෂණාවරණය මගින් ආවරණය කළ හා නොකළ දෑ පිළිබඳ දැනගැනීම සඳහා රක්ෂණ ඔප්පුවේ පිටපතක් ලබාගෙන කියවීම ඉතා වැදගත්ය.
- මෝටර් වාහන රක්ෂණාවරණයක් ලබාගැනීමේදී අවශ්‍ය කරන අතිරේක ආවරණ තිබේනම් ඒ පිළිබඳ නිසි පැහැදිලි කිරීමක් රක්ෂණ සමාගමෙන් / රක්ෂණ තැරැව්කාර සමාගමෙන් / රක්ෂණ නියෝජිතයාගෙන් ලබාගෙන ඔබගේ අවශ්‍යතාවයට ගැලපෙන අතිරේක ආවරණ පමණක් ලබාගැනීම කළ යුතුය.
- රක්ෂණාවරණය ලබාගැනීමට පෙර වාහනය සම්බන්ධයෙන් තිබෙන අනෙකුත් ලියකියවිලි නිසි පරිදි යාවත්කාලීන කර ගත යුතුය.

**ආ) නොකළ යුතු දෑ;**

- වෙනත් කිසිම බාහිර පාර්ශවයකට තමාගේ රක්ෂණ යෝජනා පත්‍රය සම්පූර්ණ කිරීමට භාර නොදිය යුතුය.
- රක්ෂණ යෝජනා පත්‍රයේ සෑම කොටසකටම පිළිතුරු සැපයිය යුතු අතර නිශ්චිත පිළිතුරක් නොමැති නම් අදාල නොවේ ලෙස සටහන් කළ යුතුය.
- කිසි විටෙකත් රක්ෂණ යෝජනා පත්‍රයේ ව්‍යාජ ප්‍රකාශ ඇතුලත් නොකළ යුතුය.

7.

## මෝටර් වාහන රක්ෂණාවරණයකින් ආවරණය වන්නේ කුමන ආකාරයේ හානිද?



සම්මත පූර්ණ මෝටර් වාහන රක්ෂණාවරණයකින් සාමාන්‍යයෙන් පහත සඳහන් අවදානම් වලින් මෝටර් වාහනයට වන හානි සඳහා ආවරණ ලබාදෙනු ලබයි.

- වාහන අනතුරු
- බාහිර පිපිරීම්
- ඇතුලතින් ගිනිගැනීම්
- අකුණු සැර වැදීම්
- සොරකම් කිරීම්

ඔබගේ ඉල්ලීම මත අතිරේක ගෙවීමකට යටත්ව අමතර ආවරණ ලබා ගත හැකි අතර ඉන් සමහරක් පහත දැක්වේ.

- කැරලි හා සිවිල් කෝලාහල, ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්
- ජලගැලීම් හා ස්වාභාවික විපත් ආවරණය කරගත හැක.

8.

## මෝටර් වාහන රක්ෂණයකින් ආවරණය නොවන හානි කවරේද?

- රියදුරු බලපත්‍රයක් නොමැතිව වාහනය ධාවනය කිරීමෙන් සිදුවන හානි
- මත්පැන් පානය කර රිය පැදවීම නිසා සිදුවන හානි
- මෝටර් රථය නීති විරෝධී කටයුතු සඳහා යොදාගැනීමෙන් සිදුවන හානි
- රක්ෂණ ඔප්පුවේ සඳහන් කර නොමැති භාවිතයන්/කාර්යයන් සඳහා මෝටර් රථය භාවිතා කිරීමෙන් සිදුවන හානි
- එන්ජින් හෝ වෙනත් කාර්මික දෝෂ
- ශ්‍රී ලංකා භූමි සීමාවන්ගෙන් බැහැරදී සිදුවන හෝ හටගන්නා අලාභ හෝ හානි

9.

# හිමිකම් නොපෑමේ වට්ටම් (No Claim Bonus) යනු කුමක්ද?

හිමිකම් නොපෑමේ වට්ටමක් යනු  රක්ෂණ ඔප්පුවේ කාලසීමාව තුළ හිමිකමක් ඉදිරිපත් නොකිරීම නිසා රක්ෂිතයාට ඉදිරි රක්ෂණ කාලපරිච්ඡේදය සඳහා වන වාරිකයට ලබාදෙනු ලබන වට්ටමකි. රක්ෂණ ඔප්පුව අලුත්කිරීම සමගම ඊට පෙර රක්ෂණ කාලපරිච්ඡේදය තුළ හිමිකමක් ඉදිරිපත් නොකරනු ලැබුවහොත් අලුත්කිරීමේ වාරිකය මත හිමිකම් නොපෑමේ වට්ටමක් ප්‍රදානය කරනු ලැබේ.



# 10.

## ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි යොමු කරන ආකාරය

### රක්ෂණ හිමිකමක් පිළිබඳව පැමිණිල්ලක් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ බලතල ප්‍රකාරව රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා රක්ෂණ හිමිකම් සම්බන්ධ පැමිණිලි විභාග කිරීම සිදු කරන අතර, ඒ සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග පහත පරිදි වේ:

පළමුව ඔබගේ රක්ෂණ සමාගම වෙත පැමිණිල්ල යොමුකරන්න. රක්ෂණ සමාගමට පැමිණිල්ල යොමු කරන ආකාරය ගැන දැනගැනීම සඳහා https://ircsl.gov.lk/list-of-insurance-companies/ වෙත පිවිසෙන්න. සමාගම සාධාරණ කාලසීමාවක් ඇතුළත එය නිරාකරණය කර, ඒ සඳහා ඔබට පිළිතුරක් ලබා දිය යුතුය.

ඔබට රක්ෂණ සමාගමෙන් සාධාරණ කාලසීමාවක් තුල පිළිතුරක් නොලැබුනහොත් හෝ පැමිණිල්ල නිරාකරණය කිරීම සම්බන්ධයෙන් ඔබ සෑහීමකටපත් නොවන්නේ නම්, ඔබගේ පැමිණිල්ල ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව හෝ රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කල හැකිය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකි ආකාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා https://ircsl.gov.lk/policyholder-complaints/ වෙත පිවිසෙන්න.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාවට මාර්ගෝපදේශයක් වශයෙන් මෝටර් වාහන රක්ෂණයක් මිලදී ගැනිමේදී සැලකියයුතු කරුණු පිළිබඳ මෙම අත්පොත නිකුත් කර ඇති අතර මෙහි මෝටර් වාහන රක්‍ෂණය පිළිබඳ සාමාන්‍ය තොරතුරු පමණක් අඩංගු වේ. මෙහි දක්වා ඇති කිසිදු තොරතුරක් රක්ෂණ ඔප්පුවක නියමයන් සහ කොන්දේසි ප්‍රතිස්ථාපනය හෝ ප්‍රතික්ෂේප නොකරයි. රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු සදහා හෝ වෙනත් අමතර තොරතුරු සදහා රක්ෂණ සමාගම, රක්ෂණ තැරැව්කාර සමාගම හෝ රක්ෂණ නියෝජිතයා අමතා ලබා ගත හැක.

INSURANCE
REGULATORY
COMMISSION
OF SRI LANKA

**වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය**
**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
11 වන මහළ, නැගෙනහිර කුළුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකථනය - 0112 2396184-9 I ෆැක්ස් - 0112 2396190
විද්‍යුත් තැපෑල - mder@ircsl.gov.lk

www.ircsl.gov.lk

https://www.facebook.com/Ircslofficialpage/

https://www.linkedin.com/company/insurance-regulatory-commission-of-sri-lanka/

https://www.youtube.com/channel/UCuM9RLGQTi7B2MM7PL7jfiA

බැඳියාව හා නොපිළිගැනීම
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාවගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම අත්පොත මුද්‍රණය කරන ලද අතර කිසිදු නීති උපදෙස් සැපයීමේ ආදේශකයක් වශයෙන් මෙය උපයෝගී කරගත නොහැක.